# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2024

# 71 - සිංහල

### ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන / සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2024

## 71 - සිංහල I

## ලකුණු බෙදී යාම

## I පත්‍රය

මේ ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් සමන්විත ය. පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය.

**පළමු ප්‍රශ්නය :-** මේ ප්‍රශ්නය (අ), (ආ), (ඉ), (ඊ), (උ), (ඌ), (එ) යනුවෙන් කොටස් හතකින් (07) සමන්විත ය.

- (අ), (ආ), (ඉ), (ඊ), (උ) අවබෝධය — ලකුණු 16 යි (4 x 4 = 16)
  (මේ කොටස් පහෙන් හතරකට (04) පමණක් පිළිතුරු සැපයිය යුතු ය.)
- (ඌ) අවස්ථා සම්බන්ධය — ලකුණු 12 යි (3 x 4 = 12)
  (i, ii, iii, iv,v, vi, vii මේ කොටස්වලින් අවස්ථා සම්බන්ධ හතරකට (04) පමණක් පිළිතුරු සැපයිය යුතු ය.)
- (එ) රසාස්වාදය — ලකුණු 12 යි.

**ලකුණු 40 යි.**

අංක 02 සිට 08 තෙක් ප්‍රශ්න නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන් සකසා ඇත. ඒ අතුරෙන් හතරකට (04) පිළිතුරු සැපයිය යුතු වේ. එක් ප්‍රශ්නයකට 15 බැගින් ලකුණු 60කි. (4 වන ප්‍රශ්නය (අ), (ආ) යනුවෙන් කොටස් දෙකකි. (අ) කොටසට ලකුණු 07කි. (ආ) කොටසට ලකුණු 08කි.)

# උත්තර පත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තර පත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතු වේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තර පත්‍ර ලකුණු කිරීමට රතු පාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තර පත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේ දී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේ දී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලි ව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනුකොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ක් තුළ භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) △ $\frac{4}{5}$

(ii) △ $\frac{3}{5}$

(iii) ........................................ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

## බහුවරණ උත්තර පත්‍ර : (කවුළු පත්‍රය)

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.
2. අනතුරු ව උත්තර පත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක් වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවක දී පැහැදිලි ව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.
3. කවුළු පත්‍රය උත්තර පත්‍රය මත නිවැරදි ව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරු ව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

## ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :

1. අයදුම්කරුවන් විසින් උත්තර පත්‍රයේ හිස් ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේ දී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තර පත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතු වේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනි ව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරී ව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තර පත්‍රයේ සෑම උත්තරයකට ම දී ඇති ලකුණු ගණන උත්තර පත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

## ලකුණු ලැයිස්තු සකස් කිරීම :

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළ දී ගණනය කරනු නො ලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙන ම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තර පත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න.

***

## අභිමතාර්ථ

**I පත්‍රය**

අ.පො.ස. (උ.පෙළ) විභාගයට පෙනී සිටින විද්‍යාර්ථීන් සතු ව පවතින:

- සම්භාව්‍ය සිංහල (නිර්දිෂ්ට) ගද්‍ය හා පද්‍ය කෘති කියවා අවබෝධ කර ගැනීමේ ශක්‍යතාව හඳුනා ගැනීම ද
- නූතන ගද්‍ය-පද්‍ය හා කාව්‍ය නිර්මාණ රස විඳීම හා තදනුබද්ධ විචාරාත්මක දෘෂ්ටිය කෙබඳු දැයි හඳුනා ගැනීම ද
- කාව්‍ය විචාර සංකල්ප හඳුනා ගෙන රස විඳීමේ හා විචාරය කිරීමේ ශක්‍යතාව මැන බැලීම ද මේ පත්‍රයෙන් අපේක්ෂිත ය.

**1.** පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) හා (උ) උද්ධෘත අතුරෙන් **සතරක්** තෝරා ගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට ද (ඌ) හා (එ) ප්‍රශ්නවලට ද පිළිතුරු සපයන්න. (මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.)

(අ) ඒ අසා බමුණාණෝ පුතණුවන් මියයා ම ත්‍යාග අදහස බලවත් වූවා සේ 'ළදරුවාණෙනි, තොපි ඉල්වන සක්සඟළ මාගේ සම්පත් බොහෝ ව ඇති බැවින් රත්රතින් වුවත් රිදියෙන් වුවත් මුතුමැණික් ආදියෙන් වුවත් තොප කියාලූ තරමෙක කරවා දෙමි. වුවමනා තරමක් කියව' යි බත් පමණකින් හා යම්තම් මිලයකින් කරවා දීලිය නොහී කුණ්ඩලාභරණය තුමූ ම කොට දුන් තැනැත්තෝ 'සත්රුවනින් සක්සඟළක් කරවා දෙමි' යි කිවුය. ඒ අසා මට්ටකුණ්ඩලී දෙව්පුත් 'මේ තමාගේ පුතුට බෙහෙත් පමණක් වුවමනා ලෙස නොකරවා පැන් වත්කළ මනා ගසට හුණුපැන් වත්කරන්නා සේ නොබෙහෙද් බෙහෙත් කොට මරා තබාලා දැන් පුතණුවන් සැටියේ ආ මා කී දෙයක් කරවා දෙමි කියයි. තරයේ ම මූ චකිත කරවා ලමි. කෙසා විත්ර සක්සඟළක් කරවා දෙවූ දැ' යි විචාළහ. 'තොප කී විතෙරකැ' යි කී කල්හි, 'මාගේ රථමැදිරිය ගෙනරන්මුවා ය. එසේ හෙයින් ඊට තරම් වතොත් හිර හා සඳ ය. ඒ දෙක සම්භ වී නම් ගමන් බලාලූ කලට ජවනහංස ජාතකයෙහි හංසරාජ ව උපන් බෝසතුන් කිසිවිටෙක පසුබටත් සෙස්සවුන්ට පසුබැස්මක් නැති හෙයින් ඉතා බලවත. එසේ හෙයින් හිර හා සඳ සම්භ වී නම් ඒ මාගේ රථය හොබ්බී. සෙසු සක්වලින් ප්‍රයෝජන නැතැ" යි කිව.

(i) බමුණා, තම පුතුට බෙහෙත් කළ ආකාරය නිරූපණය කෙරෙන උපමාව කුමක් ද?

(ii) මට්ටකුණ්ඩලී දිව්‍ය පුත්‍රයා තමාගේ රථයට ගැළපෙතැයි කී චක්‍ර යුගලය කුමක් ද?

(iii) "නොබෙහෙද් බෙහෙත් කොට මරා තබාලා" මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) '**සක්වලින්**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

1. (අ)

i. පැන් වත්කළ මනා ගසට හුණුපැන් වත්කරන්නා සේ

ii. ඉර, සඳ / සූර්ය, චන්ද්‍ර

iii. බෙහෙත් නොවන දේ බෙහෙත් ලෙස දී මරණයට පත් කර

iv. රෝදවලින් / චක්‍රවලින් රෝද / චක්‍ර

( ලකුණු 1×4 =ලකුණු 4 යි.)

(ආ) එවේලෙහි ජීවකයෝ සිටාණන් ඇඳෙක උඩු බලා වැදහොවා සියලඟ නොසැලෙන සේ ඇඳ හා එක් කොට පටපිළියෙන් වෙළා සිටාණන් ඉස්දොර වැදහිඳ සූක්ෂ්ම වූ සැතක් ගෙන සිටාණන් ඉස්බොල්ල පළා තුන් සන්ධිය වෙන් කොට ඉස්මුල් කන පණුවන් දෙදෙනා සැත්තුඩින් ගෙන එළියේ ලූහ. එළියේ ලා "මේ සත්දවසින් කා මරන පණුය. මේ පස්දවසින් කා මරන පණුය" යි කියා පෑහ. ඒ විස්ම දුටු මහපිරිස එකවිට ම සාධුකාර දුන්හ. එවේලෙහි ජීවකයෝ සිටාණන් හිස්බොල්ල පෙර සේ ම සන්ධි කොට ලොමකුත් අඩුවැඩි නොකොට තබා බැහැනි ගෙන ඖෂධ ගල්වා සිටාණන් සත්දවසක් එම ශයාාවෙන් සතපා දකුණැලයෙන් සත්දවසක් සතපා. වමැලයෙන් සත්දවසක් සතපා පෙර එක් විසිමසකට නියම කරවාගත් පිළියම එක්විසිද්වසින් ගොඩනඟා සිටාණන් හිස්මුල් අටගන්වා පැළු තැන නොපෙනෙන සේ වණය සුව කළහ.

(i) ඉස්මුල් කන පණුවන් ඉවත් කිරීම සඳහා සැත්කම සිදු කළ ආකාරය කෙබඳු ද?

(ii) සැත්කමෙන් පසු වණය සුව වීමට ගත වූ කාලය කොතරම් ද?

(iii) "සිටාණන් හිස්මුල් අටගන්වා පැළු තැන නොපෙනෙන සේ වණය සුව කළහ" මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) 'බැහැනි ගෙන' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

(ආ)

i. හිස්කබල පලා සන්ධි තුන වෙන් කිරීමෙන්

ii. දින විසිඑක යි / දින 21 යි.

iii. සිටාණන්ගේ හිස්කබලෙහි කොටස් පෑහෙන්නට සලස්වා පැළු තැන නොපෙනෙන සේ තුවාලය සුව කළහ/කළෝ ය.

iv. ශල්‍යකර්මයකින් පසු කරන ලද වෙළුම් යොදා / සැත්කමට භාජන කරන ස්ථානයේ කරන බැඳුම් යොදා

( ලකුණු 1×4 =ලකුණු 4 යි.)

(ඉ) "සොඳුර තොප ඉණ තුබූ ඉණකඩින් තොප පලන් ආභරණ ගලවා බැඳ දී ලන්න. එතර තිබා අවුත් තොප කැඳවා ගෙන යෙමි" කියන්නා "යහපතැ" යි ඒ නියාවට තමා ඉණ තිබූ ඉණ කඩෙහි තමා **පලන්** ආභරණ ගලවා බැඳ දී ලන්නා සොර දෙටු ඇරගෙන ගඟින් එතර පීනා ගොස් යන්ට ආකාර දක්වාලී ය. ස්ත්‍රිය කියන්නී "ඇයි ස්වාමි පුත්‍රයාණෙනි, මා ඇර පියා නික්මුණු නියා දැ?" යි කියන්නී "තොපගේ පරණ සමණන්ට කළ දැ දුටු කල මට තමා ම ඉවී ද? තිගෙන් මට ප්‍රයෝජන නැතැ" යි කියා නික්මුණාහ. ස්ත්‍රී ගඟ සමීපයේ බැද්දේ උන්නී ය. ශක්‍රයෝ මෙපවත් දැන පඤ්චසිඛයා හා මාතලී දිව්‍ය පුත්‍රයා කැඳවා කියන්නාහු "අසවල් ගඟ සමීපයේ උන් ස්ත්‍රී වෙහෙසන්ට උව මැනවැ" යි කියා පඤ්චසිඛයා උකුසු වෙසක් හා මාතලී දිව්‍ය පුත්‍රයා මත්ස්‍ය වෙසක් හා ශක්‍රයෝ තුමූ කැණහිල් වෙසක් මවාගෙන කටින් දඩ මස් කැටියක් ඩෑ ගෙන...

(i) මෙම ඡේදයෙහි සඳහන් පරිදි සොර දෙටුවා ස්ත්‍රිය අත හැර යෑමට හේතු වූ කාරණය කුමක් ද?

(ii) ස්ත්‍රිය වෙහෙසට පත් කිරීම සඳහා ශක්‍රයා තව කී දෙනකු කැඳවූයේ ද?

(iii) "තොප ඉණ තුබූ ඉණකඩින් තොප පලන් ආභරණ ගලවා බැඳ දී ලන්න" මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) '**පලන්**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

i. ස්ත්‍රිය ඇගේ පැරණි හිමියාට කළ දේ තමාට ද සිදු කරනු ඇතැයි වූ සැකය

ii. දෙදෙනකු / 2

iii. තොප පැලඳ ඇති ආභරණ ගලවා ඉණෙහි ඇති රෙදි කඩින් බැඳ දෙන්න

iv. පැලඳි/ පැලඳ සිටි/ පැලැඳ සිටියා වූ

( ලකුණු 1×4 =ලකුණු 4 යි.)

(ඊ) මෙසේ උද්දාලබ්‍රාහ්මණයා විසින් කියන්නාවූ ඒ වචනය අසා ඔහුගේ මිත්‍ර ජනයෝ එක් ව කියන්නාහු "එම්බා ආචාරිනී, තෙපි දැන් යම් ස්ත්‍රියක් ප්‍රාර්ථනා කරා නම් ඕතොමෝ උත්තම ජාතීන් විසින් සහවාසයක් නොකට යුත්තා වූ චණ්ඩාල කෙල්ලක් මය; කිමෙක් ද ආචාරිනී, ඉතා ළං විය නොහැකි දුගඳ පිළිකුල් වූ අපවිත්‍ර අමේධ්‍යය හා මනෝඥ වූ සුවඳ විහිදුනා සිහිල් සඳුන් හා දෙක කවර කලෙක කෙසේ නම් එක් වේ ද? සමාන නොවන හෙයින් එක් නොවන්නේ මය; එබැවින් කිසි කලෙකත් එක් නුව මනා හීනජාතීන් හා සහවාසය කරන්නාවූ උත්තම සත්වයාගේ ශ්‍රී කාන්තාවය කීර්තිය ආයුෂය ශරීරබලය නුවණය යන මෙකී සියල්ල ම ඔහු අත්හැර දුරු ව පලා යන්නේය; එතෙම කෙළවර බොහෝ **අයශස්** අසා නින්දාවට පැමිණෙන්නේ" යි කීහ.

(i) මෙම ඡේදයෙහි දැක්වෙන පරිදි කවර කලෙක වත් එක් නො වන්නා වූ වස්තු දෙක කවරේ ද?

(ii) උත්තම සත්ත්වයා වෙතින් පලා යන කරුණු කීයක් මෙහි සටහන් වේ ද?

(iii) "ඕතොමෝ උත්තම ජාතීන් විසින් සහවාසයක් නොකට යුත්තා වූ චණ්ඩාල කෙල්ලක් මය" මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) '**අයශස්**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

i. අසුචි සහ සඳුන්

ii. පහ යි. (එම කරුණු පහ ලියා තිබුණ ද ලකුණු ලබා දෙන්න.)

iii. ඇය උත්තම කුලයේ වූවන් විසින් ආශ්‍රය නොකළ යුතු වූ සැඩොල් කෙල්ලක් ම ය.

iv. අපකීර්ති / අපුසංද

( ලකුණු 1×4 =ලකුණු 4 යි.)

(ඩ) නැත රිවි රැස් පහ ස
නොපිපෙන තඹුරු වන ලෙ ස
ඔහු වෙණ නදින් මි ස
අනික් නදකින් අපි නොවෙමු තො ස

දුමන මුල් ඉදු රූ
ලවන ලොබ ලිය පදු රූ
එවෙණ නද මිණු රූ
සවන නොකරති කෙනෙක් කවු රූ

(i) 'ලොබ ලිය' යන්න කවර අලංකාරයකට අයත් වේ ද?
(ii) දෙ වන පද්‍යයෙහි 'වීණා නාදයෙහි මිහිරි බව' දැක්වීමට කරුණු කීයක් දක්වා තිබේ ද?
(iii) "නොපිපෙන තඹුරු වන ලෙස" මෙය ලිහිල් බසින් ලියන්න.
(iv) 'දුමන' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

(ඩ)

i. රූපකාලංකාරයට
ii. දෙක (02) යි.
iii. නොපිපෙන්නා වූ නෙලුම් වනය සේ. /විකසිත නොවන
iv. දොම්නස / කලකිරීම / දෝමනස්සය/ විෂාදය

( ලකුණු 1×4 =ලකුණු 4 යි.)

- (ඬ) සහ (ඪ) ප්‍රශ්න දෙකට ම පිළිතුරු සපයන්න.

(ඬ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් හතරක අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) "තොප මට සිනාසෙන්ට කාරණා කිම් ද?"
(ii) "සමහර කලෙක ජරාව පළමුව යෙයි. සමහර කලෙක ජරාවට මරණ පළමුව යෙයි."
(iii) "කවර දවසෙක අවුත් කොයිදී මා හා කථා කළේ දැයි?"
(iv) "මරණ නම් අදය සෙටය යි දැනගත නොහැක්ක; ඒ නියමයෙක් නැත."
(v) "අනේ, අප්පොච්චියෙ, ඔච්චර ම යි අපි ළඟ තියෙන්නෙ, අපි බොහොම අසරණ මිනිස්සු."
(vi) "ඉබ්බ දියට දමන කොට ඇන්නෑවෙ කියපි යන කියමන මට සිහි විය."
(vii) "යෞවනයේ සුවඳ මල් ද
යෞවනයේ මිහිරි පල ද
සරසවියගෙ පුදසුන මත
මැලවී ඇත තුබූ අයුරු." (ලකුණු 03 × 4 = 12 යි.)

(ඬ)

i. කුරුණෑගල අවධියේ දී ලියැවුණු පන්සිය පනස් ජාතක පොතේ චුල්ලධනුද්ධර ජාතක කතාවෙන් උපුටා ගන්නා ලද්දකි. සිගාල වේශයෙන් පැමිණි ශක්‍රයාට මත්ස්‍යයාත්, මාංස කැටියත් අහිමි වූ බව දුටු බිසව සිනාසෙන විට සිනාසෙන්නේ මන්දැයි සිගාලයා (ශක්‍රයා) විමසන අවස්ථාව හා බැඳේ. සිගාලයා (ශක්‍රයා) විසින් ස්ත්‍රියට ප්‍රකාශ කරන ලද්දකි.
ii. දඹදෙණි අවධියේ දී බුද්ධපුත්‍ර හිමියන් විසින් රචිත පූජාවලියේ අනුරුද්ධ කුමාර කථා වස්තුවෙන් උපුටා ගත් පාඨයකි. අනුරුද්ධ කුමාරයා මහණ වීම සඳහා යෑමට භද්දිය රජුගෙන් විමසන විට අනුරුද්ධ කුමාරයා විසින් භද්දිය රජුට පවසන ලද්දකි.
iii. දඹදෙණි අවධියේ දී ධර්මසේන හිමියන් විසින් රචිත සද්ධර්මරත්නාවලියේ මට්ටකුණ්ඩලී කථා වස්තුවෙන් උපුටා ගන්නා ලද්දකි. අදින්න පුබ්බක බමුණාගේ නිවසට බුදුන්වහන්සේ පැමිණ දන් වළඳා අවසානයේ මට්ටකුණ්ඩලී දිව්‍ය පුත්‍රයා පිළිබඳ ව අදින්න පුබ්බක බමුණා බුදුන්වහන්සේගෙන් ප්‍රශ්න විමසන අවස්ථාව හා බැඳේ. අදින්න පුබ්බක බමුණා විසින් බුදුන් වහන්සේට පවසන ලද්දකි.

iv. ගම්පොළ අවධියේ දී දෙ වන ධර්මකීර්ති හිමියන් විසින් රචිත සද්ධර්මාලංකාරයේ නන්දිවාණිජ කථා වස්තුවෙන් උපුටා ගන්නා ලද්දකි. ශිව අමාත්‍යයා නන්දිය වෙළෙන්දාගේ භාර්යාවට දෙ වන වර දෙ දහසක් පඬුරු යැවූ විට වෙළෙඳ භාර්යාව විසින්, අමාත්‍යවරයා එවූ කෙල්ලට පැවසූ ප්‍රකාශයකි.

v. ලෙනාඩ් වුල්ෆ් විසින් රචිත 'විලේජ් ඉන් ද ජංගල්' නවකථාවේ සිංහල අනුවාදය වන ඒ. පී. ගුණරත්නගේ බැද්දේගම කෘතියෙන් උපුටා ගන්නා ලද පාඨයකි. සිලිඳුගේ අසනීපය සුව කර ගැනීමට බෙරගම ගොස් එන අතරමග දී සන්‍යාසියකු ළඟට ගිය අවස්ථාවේ තෝල්කයා පඬුරු ලබා ගෙන 'පඬුරු බෝහොම කුඩා යැ' යි කියූ විට බබුන් විසින් තෝල්කයාට පවසන ලද්දකි.

vi. ජී. බී සුරවීර විසින් රචිත 'අකුරට යන වෙලාවේ' කෙටිකතාවෙන් උපුටා ගන්නා ලද්දකි. කරුණාපාලගේ නිවසේ මෙහෙකාරකමට කැඳවාගෙන ගිය 'මැණිකා'(සුභද්‍රා) නැවත ගමට රැගෙන යැමට ඇගේ පියා පැමිණි අවස්ථාවේ ඒ බව මැණිකාට පවසන විට එම කතාබහට සවන් දී සිටි කථකයා ( සිරි) මෙසේ සිතයි.

vii. එදිරිවීර සරච්චන්ද්‍ර විසින් රචිත පෙමතො ජායතී සොකො නාට්‍යයෙන් උපුටා ගන්නා ලද්දකි. උද්දාල බමුණා විසින් ස්වර්ණතිලකාට විවාහ යෝජනා කළ අවස්ථාවේ එය ප්‍රතික්ෂේප කරන ඇයට උද්දාල බමුණා විසින් පවසන ලද්දකි.

**ලකුණු දීමේ නිර්ණායක**

| | |
|---|---|
| කතුවරයා, කෘතිය , කථා වස්තුව/කතාව සඳහා | - ලකුණු 1 යි. |
| කා විසින් කාට කියන ලද ද | - ලකුණු 1 යි. |
| අවස්ථාව | - ලකුණු 1 යි. |

(ඒ) වස්තු විෂය හා කාව්‍ය භාෂාව කෙරෙහි අවධානය යොමු කරමින් පහත සඳහන් පද්‍ය පන්තිය පිළිබඳ රසාස්වාදයක් කරන්න.

**සමනොලයෙකුට**

තුඹතල ළහිරු බබළයි උණුසුම් ය පවන්
බිඟුකැල උරයි වන මල් රොන් රසය තවත්
එහිලොල නොවී පියඹා ආ ගමන මෙවන්
සමනොල මිතුර නුඹට යි මගෙ ආයුබොවන්

ද ඔ රන් සුණෙන් හෙබි සිරියල් තලාවක
සුබ සිරි හඳුන්වා සුපුරුදු වෙලාවක
සිඹ සිඹ කුඩා ගස් වන මල් බලා නෙක
නුඹ ආ ගමන සිපද ගායනාවෙක

ගණනිල් තණග පිනි ටික ටික මැකෙද්දී
සුවිසල් අරුණු දද පෙරඹර දිලෙද්දී
රොනවුල් සුළං රැළි දකුණෙන් වැදෙද්දී
සිරියල් බිමෙක වී ද නුඹ හිරු නැඟෙද්දී

හේන්වල මුවන් වට පිට බලද්දී
රාං කුරුල්ලන් තුති ගී කියද්දී
පාන්දර හීන් හිරිකඩ වැටෙද්දී
තේන්, හඳුනත්ට බැහැ මල් පිපෙද්දී

තම තුනු කැලුම් සිලිලෙන් නැහැවේවී වරෙන්
මල් වාරමක භතියෙන් නැළවේවී වරෙන්
කවුරුත් නුඹට ආදරයයි, එදැන වරෙන්
සමනොල පුෂ්පරාගය මා ළඟට වරෙන් (ලකුණු 12 යි.)

(එ) කොළඹ අවධියේ ආනන්ද රාජකරුණා විසින් රචිත පද්‍ය පන්තියකි. ස්වභාව සෞන්දර්යයේ විස්මිත නිර්මාණයක් වූ සමනලයාගේ ජීවන රටාව ළමා ලෝකය හා බද්ධ ව ඇති බව වස්තු විෂය කොට ගත් මෙම පද්‍ය පන්තිය සඳහා ප්‍රස්තුතයට අදාළ භාෂා ව්‍යවහාරයක් යොදා ගෙන ඇත.

- ළමා ලෝකය හා සම්බන්ධ සරල බස් වහරක් යොදා ගෙන ඇති බව
  උදා:
  සමනොල මිතුර , කුරුල්ලන්, මුවන්
- සංකල්ප රූප භාවිතය
  උදා:
  සමනොල පුෂ්පරාගය, දඹ රන් සුණෙන් හෙබි සිරියල් තලාවක, නුඹ ආ ගමන සීපද ගායනාවෙක
- අනුප්‍රාසවත් වචන භාවිතය
  උදා:
  සිඹ සිඹ, ටික ටික, වට පිට
- එළිවැට ආරක්ෂා කරමින් සිවුපද ආකෘතියක් භාවිත කිරීම

උදා:

මැකෙද්දී
දිලෙද්දී
වැදෙද්දී
නැහෙද්දී

- කාව්‍ය භාෂා ලක්ෂණ
  - පුරාතන පද්‍ය කාව්‍ය භාෂාවේ ආභාසය ලබා තිබීම
    උදා:
    බිඟු කැල, දඹ රන් සුණෙන්, ගණනිල්, තණග, එගි ලොල, තුනු කැලුම්
  - කට වහරට නැඹුරු වූ බස් වහර
    උදා:
    උරයි, රාං කුරුල්ලන්, මා ළඟට වරෙන්, කවුරුත්, හීන් හිරිකඩ
  - අලංකාර භාවිතය
    උදා: සමනොල පුෂ්පරාගය

ආදි කාව්‍යමය භාෂා ලක්ෂණ යොදා ගනිමින් පද්‍ය රසාස්වාදය කර තිබීම අපේක්ෂා කෙරේ.

(ලකුණු 12 යි.)

2. (අ) "සද්ධර්මරත්නාවලී කතුවරයාගේ අරමුණ වූයේ, ධර්මය දැන, පින්කම් කිරීමත්, එමගින් නිවන් සාදා ගැනීම සඳහා සත්පුරුෂයන් මෙහෙයවීමත් ය." මෙම ප්‍රකාශනය නිර්දිෂ්ට කථා වස්තු ආශ්‍රයෙන් විමර්ශනයට ලක් කරන්න.

**නැත හොත්**

(ආ) "ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයේ ම දුර්වලතා සහ ප්‍රබලතා හඳුනා ගෙන ධර්මෝපදේශ මාර්ගයෙන් ජනතාව යහමගට ගැනීමට ජාතක කථා කර්තෘවරුන් ප්‍රයත්න දරා ඇත." නියමිත කථා වස්තුවලින් නිදසුන් දක්වමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 15 යි.)

**(අ)**

සද්ධර්මරත්නාවලී කතුවරයාගේ අරමුණ වී ඇත්තේ ධර්මය දැන, පින්කම් කිරීමත්, එමගින් නිවන් සාදා ගැනීම සඳහා සත්පුරුෂයන් මෙහෙයවීමත් බව පිළිතුරෙන් ප්‍රකාශ වී තිබිය යුතු ය.

- ...මාවබෝධය පිණිස දහම් කරුණු පැහැදිලි කර දීම
- ...ධ පුණ්‍ය කර්මවලට ජනතාව යොමු කරවීම
- ...ර්මානුකූල ව ජීවත් වීමට උපදෙස් ලබා දීම සහ කථාවසානයේ දී නිර්වාණය අරමුණු කොට තිබීම
- ...දින්න පුබ්බක බමුණාගේ ලෝභී ස්වභාවය දුරලා, පිනට නැඹුරු කිරීම

- මට්ටකුණ්ඩලී කථා වස්තුවේ දක්වන පරිදි සිදු කරන ලද පුණ්‍ය කර්මය ඉතා කුඩා වුවත් නිවන් සම්පත් ලබා ගැනීම සහ දෙව් ලොව යෑම ආදි මහත් ප්‍රතිඵල ගෙන දුන් බව දැක්වීම
- කුණ්ඩලකේසී කථාවෙන් ජීවිතයේ යම් අවස්ථාවක කිසි යම් අපරාධයක් සිදු කළ අයකුට වුව ද ජීවිතාවබෝධය ලබා ගෙන මෙලොව පරලොව ජීවිත සරු කර ගැනීමට හැකි බව දැක්වීම

ඉහළ ලකුණක් පිරිනැමීමේ දී කථා වස්තු දෙකෙන් ම මෙවැනි වූ කවත් නිදසුන් යොදා ගෙන තිබීම ගැන සැලකිලිමත් වන්න.

නැතහොත්

(ආ)

වුල්ලධනුද්ධර ජාතකය

- මෙම ජාතකයේ කාමය මුල් කර ගෙන අපරාධයකට යොමු වන කාන්තාවක් ප්‍රධාන චරිතය වේ. ඇය තම සැමියා මරුමුවට පත් කිරීමට නිකාමතා ම යොමු වෙයි. එහි ප්‍රතිඵලයක් ලෙස කිසිවකුගේ රැකවරණයක් නොමැති ව රුදුරු වනයෙහි ඇය තනි වෙයි.
- සොර දෙටුවා තම අභිමානය සුරකිනු වස් චුල්ලධනුද්ධර කුමාරයා මරණයට පත් කළ ද අනාගතයේ තමාට එම කාන්තාවගෙන් එල්ල විය හැකි විපත අවබෝධ කර ගෙන ඇය අත් හැර පලා යයි.
- චුල්ලධනුද්ධර කුමරු තමා උගත් ශිල්පය පිළිබඳ ව අභිමානයෙන් කටයුතු කළත් ස්ත්‍රියගේ ස්වාධීන තීරණය නිසා ඔහු මරණයට පත් වෙයි.

**චන්දකින්නර ජාතකය**

- මෙම ජාතක කතාවේ එන බරණැස් රජතුමා සඳ කිඳුරා මරණයට පත් කිරීමේ අරමුණින් හීයකින් ඔහුට විදින්නේ කිඳුරිය කෙරෙහි හට ගත් කාමරාගී සිතුවිලි නිසා ය. එයින් නො නවතින රජු තමා ප්‍රතික්ෂේප කරන කිඳුරියට තව දුරටත් ආයාචනා කරන්නේ රාගය නිසා ම ය. ඔහු පෙරළා රජමාලිගයට ගමන් කරන්නේ අපේක්ෂා භංග වූවකු පරිද්දෙනි.
- කිඳුරියගේ පතිවත් බලය නිසා ලැබුණු ශක්‍ර දේවියාගේ සහායෙන් කිඳුරා යළිත් ප්‍රාණය ලබයි.

මෙබඳු යෝග්‍ය උදාහරණ ජාතක කථා දෙකෙන් ම ඉදිරිපත් කර තිබීම කෙරෙහි සැලකිලිමත් වෙමින් ලකුණු ප්‍රදානය කරන්න.

(ලකුණු 15 යි.)

3. (අ) සමාජයෙන් පැන නගින විවිධ අභියෝගවලට කාන්තාව මුහුණ දෙන ආකාරය නිරූපණය කිරීමෙහි ලා සද්ධර්මාලංකාර කතුවරයා දක්වන සාමර්ථ්‍යය නිර්දිෂ්ට කථා ආශ්‍රයෙන් විමසන්න.

නැත හොත්

(ආ) පූජාවලී කර්තෘවරයා අප්‍රධාන චරිත රාශියක් උපකාරී කොට ගැනීමෙන් ප්‍රධාන චරිතය ඉස්මතු කොට දැක්වීමේ ශිල්පීය උපක්‍රමය භාවිත කොට ඇති ආකාරය නිර්දිෂ්ට කථා ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15 යි.)

## 3. (අ)

මෙහි දී සමාජයෙන් පැන නගින අභියෝගවලට මුහුණ දෙන කාන්තා චරිත පිළිබඳ විස්තරයක් ඇතුළත් වී තිබිය යුතු ය.

- ස්වර්ණතිලකා වස්තුවේ එන ප්‍රධාන චරිතය විවිධ තරාතිරම්වලට අයත් පුරුෂයන්ගෙන් එල්ල වූ අභියෝගවලට මුහුණ දී උද්දාල බ්‍රාහ්මණයා කරා ගොස් ඔහු ද ග්‍රහණයට ගැනීමට සමත් වීම. මීට අමතර ව,
  - ✓ ඇතැම් රජවරුන් ඇය නිසා මරණයට පත් වීම පිළිබඳ ව ඇති වූ ගැටලු ජයග්‍රහණය කිරීම
  - ✓ නොපසුබට ධෛර්යයෙන් උද්දාල බ්‍රාහ්මණයා මුණ ගැසීම තෙක් ඉදිරියට යෑම ආදිය නිදසුන් ලෙස දැක්විය හැකි ය.

- නන්දිවාණිජ කථා වස්තුවේ දී වෙළෙන්දාගේ බිරිඳ ද ශිව අමාත්‍යයා ඉදිරිපත් කළ යෝජනා යටපත් කරමින් පතිව්‍රතාව ආරක්ෂා කරගෙන ජීවත් වීමට සමත් වීම

තවදුරටත්,

- ✓ ශිව අමාත්‍යයා උපක්‍රමශීලී ව වෙළෙඳ භාර්යාව ග්‍රහණයට ගැනීමට තැත් කළත් ඒවායින් ගැලවීම
- ✓ ජීවිත හානියක් වීම ද වළක්වා ගෙන තමා පසුපස එන ශිව අමාත්‍යයාගේ කාම චේතනාව දුර්වල කිරීමට ඇය සමත් වීම ආදි කරුණු ද මේ සඳහා යොදා ගත හැකි ය.

නැතහොත්

**(ආ)**

පූජාවලී කතුවරයා අප්‍රධාන චරිත රාශියක් උපයෝගී කර ගනිමින් ප්‍රධාන චරිතය වඩාත් ඉස්මතු කොට දක්වා ඇති ආකාරය මෙහි දී පැහැදිලි විය යුතු ය.

**ජීවක වෛද්‍යවරයාගේ කථාව** - [illegible]

- ➢ අභය රාජ චරිතය
- ➢ දිසාපාමොක් ඇදුරුතුමාගේ චරිතය
- ➢ සාකේත නුවර සිටු දේවියගේ චරිතය
- ➢ බිම්බිසාර රජුගේ චරිතය
- ➢ රජගහනුවර සිටුතුමාගේ චරිතය
- ➢ බරණැස් සිටුතුමාගේ පුත්‍රයාගේ චරිතය
- ➢ චණ්ඩප්‍රද්‍යෝත රජතුමාගේ චරිතය
- ➢ සෙසු වෙදවරුන්ගේ චරිත

ආදිය ඇසුරු කොට ගෙන ජීවක වෛද්‍යවරයාගේ චරිතයේ ශ්‍රේෂ්ඨත්වය දක්වා ඇත.

අනුරුද්ධ කුමාර කථාව

මේ කතා වස්තුවේ දී,

- ➢ සඳ නම් දේවිය (අනුරුද්ධ කුමාරයාගේ මව)
- ➢ මහානාම කුමරු
- ➢ භද්දිය කුමරු
- ➢ උපාලි කපුවා
- ➢ කිම්බිල
- ➢ දේවතාවා

යනාදි චරිත ඇසුරින් අනුරුද්ධ කුමාරයාගේ ශ්‍රේෂ්ඨත්වය ඉස්මතු කොට ඇත.
මේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දීමේ දී කථා වස්තු දෙකෙන් ම චරිත දෙක බැගින් වත් තෝරා ගෙන තිබීම සාර්ථක පිළිතුරකින් අපේක්ෂා කෙරේ.

(ලකුණු 15 යි.)

4. (අ) කෝට්ටේ අවධියේ සිංහල පද්‍ය සාහිත්‍යයේ උන්නතියට හේතු වූ තත්කාලීන සමාජ හා සංස්කෘතික පසුබිම කරුණු තුනක් පමණ ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 07 යි.)

(ආ) "සිදුහි [illegible] ඊට අනුකූල චරිත නිරූපණය වන ආකාරය මනා ලෙස දැක්වීමෙහි [illegible] ගුත්තිල කාව්‍යයේ [illegible] වී තිබේ" යන්න [illegible] ඇසුරෙන් උක්ත කාරණය [illegible] කරන්න. (ලකුණු 08 යි.)

**4. (අ)**

මේ ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී කෝට්ටේ අවධියේ දී භාවිත වූ පද්‍ය සාහිත්‍යයේ වර්ධනයට හේතු වූ තත්කාලීන සමාජ හා සංස්කෘතික පසුබිම පිළිබඳ කරුණු ඇතුළත් වී තිබිය යුතු ය. මේ සඳහා අදාළ කර ගත හැකි කරුණු කිහිපයක් මෙසේ ය.

- I. ගිහි – පැවිදි උගතුන් පිරිසක් පද්‍ය කාව්‍ය නිර්මාණයෙහි නියුක්ත ව සිටීම
- II. ගුරුකුල ක්‍රමය ක්‍රියාත්මක වීම - [illegible]
- III. කාව්‍ය රචකයන්ට රාජ්‍ය අනුග්‍රහය ලැබීම
- IV. සමෘද්ධිමත් ආර්ථික සහ සාමකාමී සමාජ වාතාවරණයක් රට තුළ ක්‍රියාත්මක වීම

තොටගමුවේ ශ්‍රී රාහුල හිමි, වෑත්තෑවේ හිමි, වීදාගම මහා මෛත්‍රේය හිමි මූලික කොට ගත් උගතුන් පද්‍ය කාව්‍ය රචනයට ඉදිරිපත් වීම නිසා පද්‍ය කාව්‍ය සාහිත්‍යයට මහා කාව්‍ය, සන්දේශ කාව්‍යප්‍රශස්ති කාව්‍ය, උපදේශ කාව්‍ය, ජාතක කාව්‍ය ආදි වශයෙන් විවිධ වර්ගවලට අයත් පද්‍ය කාව්‍ය නිර්මාණ බිහි වීම.

අරණ්‍ය වාසී සහ ග්‍රාම වාසී භික්ෂු පරම්පරා දෙකක් ක්‍රියාත්මක වීම නිසා එක් පක්ෂයකින් ප්‍රකාශයට පත් වන කෘතියකට පිළිතුරු වශයෙන් අනෙක් පක්ෂයෙන් ද කෘති බිහි වීම. ගිරා - හංස තරගය ඊට නිදසුනකි.

අර්බුදකාරී ස්වභාවයක් නැති ව රට සාමකාමී වූ නිසා රාජ්‍ය සහයෝගය ද පද්‍ය කාව්‍ය රචකයන්ට ලැබීම.

**මෙවැනි කරුණු ඉහත සඳහන් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී ඉදිරිපත් කොට තිබිය යුතු ය.**

**(ලකුණු 07 යි.)**

(ආ)

ගුත්තිල කාව්‍යය රචනා කිරීමේ දී කතුවරයා තෝරා ගෙන ඇති ප්‍රධාන සිද්ධි සහ ඒ සිදුවීම්වලට සම්බන්ධ ව ක්‍රියාත්මක වන චරිත පිළිබඳ වැටහීමකින් යුතු ව මේ සඳහා පිළිතුරු ලබා දිය යුතු වේ.

I. වෙළෙඳුන් සහභාගී වූ සැණකෙළිය
II. මූසිලට එල්ල වූ අභියෝගය ජයග්‍රහණය කරනු වස් ගුත්තිල පඬිවරයා සොයා ගිය ගමන
III. ගුත්තිල පඬිවරයාගෙන් ශිල්ප ලබා ගත් අවස්ථාව
IV. වැටුප් ප්‍රශ්නය මතු වීම
V. රජුගේ මූලිකත්වය යටතේ පැවැත්වූ වීණා වාදන තරගය
VI. නළඟන රැඟුම් සමග පුරවැසියන්ගේ ක්‍රියා කලාප

ආදි වශයෙන් ප්‍රධාන සිදුවීම් පෙළක් ලේඛකයා තෝරා ගෙන ඇති බව දැක්විය යුතු අතර, ඒ ඒ අවස්ථාවට සම්බන්ධ වූ චරිත සහ ඔවුන්ගේ ක්‍රියා කලාප පිළිබඳ විස්තරයක් පිළිතුරට ඇතුළත් වී තිබිය යුතු ය. අදාළ අවස්ථා දැක්වෙන සිද්ධි තුනක් වත් ඇසුරෙන් චරිත ක්‍රියාත්මක වන ආකාරය පැහැදිලි කොට තිබිය යුතු ය.

**(ලකුණු 08 යි.)**

5. "ලෙනාර්ඩ් වුල්ෆ්ගේ වෑයම වූයේ, යටත් විජිත පාලනයේ පැවති යථාර්ථය හඳුනා ගැනීමත් එය කලාත්මක ව නිරූපණය කිරීමත් ය." බැද්දේගම නවකථාව ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි.)

5. යටත් විජිත පාලන ක්‍රමයේ යථාර්ථය හඳුනා ගැනීමත්, එය කලාත්මක ව ඉදිරිපත් කිරීමත් බැද්දේගම නවකථා රචකයාගේ අභිප්‍රාය වී ඇති බව මෙයින් පැහැදිලි විය යුතු ය.

- පාලකයන්ගේ අනවධානය නිසා පරිහානියට පත් වන ජන ජීවිතය පිළිබඳ යථාර්ථය දක්වා තිබීම
- කලාත්මක නවකථාවක් ලෙස ඉදිරිපත් කිරීමේ දී රසවත් කතා පුවතක් මුල් කර ගැනීමත්, අවස්ථා, චරිත, සිද්ධි ආදිය වර්ණනාත්මක භාෂා රටාවක් අනුව ඉදිරිපත් කර ඇති අයුරු නිදසුන් ඇසුරෙන් විභාග කර ඇත්නම් සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න.

උදා:

✓ නීතියේ ආධිපත්‍යය බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට අනුව ක්‍රියාත්මක වීම
✓ ස්වදේශිකයන් නො දන්නා භාෂාවක් පදනම් කර ගනිමින් පරිපාලන කටයුතු සිදු කිරීම
✓ යටත්විජිත බලපෑම නිසා ග්‍රාමීය ජනතාව සූරාකෑමට ලක් වීම
✓ මූලික මානුෂික අයිතිවාසිකම් උල්ලංඝනය වීම

**(ලකුණු 15 යි.)**

**6.** කෙටිකතාවක "ජීවන දෘෂ්ටිය" යනු කුමක් දැයි පැහැදිලි කොට, එය ඇල්විවල නන්දිමිත්‍රගේ 'නංගී' කෙටිකතාවේ පිළිබිඹු වන ආකාරය පරීක්ෂා කරන්න. (ලකුණු 15 යි.)

6. මෙහි දී ජීවන දෘෂ්ටිය පිළිබඳ විවරණයක් ද එය නංගී කෙටි කතාවේ දැක්වෙන ආකාරය ද විස්තර වී තිබිය යුතු ය.

- කිසියම් නිර්මාණකරුවකු තමා ඉදිරිපත් කරන නිර්මාණයෙන් ජීවිතාවබෝධය ලබා දෙන ඇති ආකාරය කුමක් දැයි එම කතාවේ නිර්මිත සිද්ධි හා අවස්ථා, චරිත මගින් ඉස්මතු වී තිබීම ජීවන දෘෂ්ටිය ලෙස දක්වා තිබිය යුතු ය.
- තම පෞද්ගලික ජීවිතය සහෝදරත්වය වෙනුවෙන් කැප කිරීම
- තම කුටුම්බය නොබිඳෙන පරිදි සහෝදරයා වෙනුවෙන් කටයුතු කිරීමට උත්සුක වීම
- අතීත සිද්ධීන් මගින් නංගීගේ ක්‍රියා කලාපය සාධාරණීකරණය කිරීම
- අවසානයේ දී තම ජීවිතය පවා පරදුවට තබා තීරණ ගැනීම තෙක් කතාව එක ම ධාරණාවකින් ගලා යෑම

ආදිය ඇසුරෙන් පිළිතුර සකස් වී තිබේ නම් එය ලකුණු ප්‍රදානය කිරීමට ප්‍රමාණවත් ය.

(ලකුණු 15 යි.)

**7.** වර්තමාන සමාජ ක්‍රමය තුළ මාපිය-දූදරු අන්තර් සම්බන්ධතාවල පැවැත්මත්, ඒවා බිඳ වැටීමත් පිළිබඳ ඛේදවාචකය නිරූපිත ආකාරය නිර්දිෂ්ට පද්‍ය රචනා කිහිපයක් වත් ඇසුරෙන් විමසන්න. (ලකුණු 15 යි.)

7. වර්තමාන සමාජ ක්‍රමය තුළ මාපිය දූදරු සම්බන්ධතාවල පැවැත්ම හා ඒවා බිඳ වැටීම මහත් ඛේදවාචකයක් ලෙස තේමා කොට ගනිමින් කොළඹ අවධියේ කවීන්ගේ කාව්‍ය විෂය පථය නිර්මාණය වී ඇති අයුරු දැකිය හැකි ය. මේ සඳහා,

- ✓ දුරු රට ගිය පුතුට (බුද්ධදාස ගලප්පත්ති)
- ✓ පොඩි දුව (මොනිකා රුවන්පතිරණ)
- ✓ රන්තැටියක කඳුළු (දයාසේන ගුණසිංහ) යන ආදි පද්‍ය නිර්මාණ පාදක කර ගත යුතු ය.
- ✓ ශූන්‍ය ළෙන සිහින

- දරුවකුගේ පැමිණීම අපේක්ෂාවෙන් දුක් වන පියකුගේ වේදනාව 'දුරු රට ගිය පුතුට' පද්‍යයට වස්තු විෂය වී ඇත.
- 'පොඩි දුව' පද්‍ය රචනයෙන් අම්මාගේ ලයේ සිට විවිධ අවස්ථාවන්හි දී ස්ත්‍රියට මුහුණ දීමට සිදු වන සමාජ තත්ත්වයේ දුක් මුසු බව ප්‍රකාශ කරයි.
- මවුපියන්ට අහිමි වන දරු සෙනෙහස පිළිබඳ දුක් මුසු පුවත 'රන්තැටියක කඳුළු' පද්‍යයෙන් අවධාරණය කර ඇත.
- මෙට සැම නිර්මාණයකින් ම සුන්දරත්වයට වඩා ජීවිතයේ වේදනාත්මක අද්දැකීම් ඉස්මතු කොට ඇති බව පෙන්වා දිය යුතු ය.

**✶ මෙම නිර්මාණ ඇසුරින් අවශ්‍ය නිදර්ශන දක්වා තිබිය යුතු ය.**

(ලකුණු 15 යි.)

8. "ආචාර්ය-ශිෂ්‍ය දෙපාර්ශ්වයේ ම වූ අභිමතාර්ථ සපුරා ගැනීමට දරන උත්සාහය නිමාවට පත්වන්නේ මහත් වූ ව්‍යසනයකිනි." පෙමතො ජායතී සොකො නාට්‍යය ආශ්‍රයෙන් සනිදර්ශන ව පහදන්න. (ලකුණු 15 යි.)

8. මෙහි දී ආචාර්ය - ශිෂ්‍ය දෙපක්ෂයේ ම අභිමතාර්ථ සහ ඒවා මුදුන් පත් කර ගැනීමට යෑමේ දී ව්‍යසනයකින් කෙළවර වන බව ප්‍රකාශ වී තිබිය යුතු ය.

- 'පෙමතො ජායතී සොකො' නාට්‍යයේ දක්නට ලැබෙන පරිදි කාන්තාවක දුටු කල කිරිපැනින් මුව දොවා, කිලිටි සෝදා පිරිසිදු වූ උද්දාල බමුණාගේ ජීවිතය ස්වර්ණතිලකා දැකීමෙන් විපර්යාසයට පත් වීම
- උද්දාල බමුණා විවාහයෙන් පසු සාර මසක් යන තෙක් ම සිප්හලට හෝ රාජ සේවාවට හෝ නො ගොස් සිටීම
- ශිෂ්‍යයන්ගේ අභිමතාර්ථය වූයේ මැනවින් ශිල්ප ලබා ගැනීම යි. ශිල්පය වූ කලී දූකෙහි හා සැපෙහි දී අත් නොහරින සදාකාලික දෙයක් ලෙස ඔවුන් පිළිගැනීම
- ශිල්ප ලබා දීමට ගුරුවරයා නොපැමිණීම පිළිබඳ සිසුන් කනගාටුවෙන් පසු වීම

  "හිඳුම පල නැත ගුරුකුලේ තව
  ඇදුරු සඳ නැත එන්නෙ කිසි කල..."

- එබැවින් ස්වර්ණතිලකා කෙරෙහි උරණ වූ සිසුන් ඇය විනාශ කිරීම
- ආචාර්ය - ශිෂ්‍ය දෙපාර්ශ්වයේ ම අභිමතාර්ථ නිෂ්ඵල වන බවත් ඒ සියල්ල ව්‍යසනයකින් කෙළවර වන බවත් දක්වා නාට්‍යය අවසන් වීම

  "පෙමතො ජායතී සොකො
  පෙමතො ජායතී භයං..."

පූර්වෝක්ත කරුණු ඇතුළත් වීම සාර්ථක පිළිතුරක් සඳහා අපේක්ෂා කෙරේ.

(ලකුණු 15 යි.)

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2024

## 71 - සිංහල II

ලකුණු බෙදීයෑම

### II පත්‍රය

I කොටස (පළමු ප්‍රශ්නය) : මෙම ප්‍රශ්නය වරණ 05 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 20කින් සමන්විත ය. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය. මෙහි එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් ලකුණු 20කි.)

II කොටස මෙම කොටස ප්‍රශ්න 07කින් සමන්විත වේ. දෙවන හා තෙවන ප්‍රශ්න අනිවාර්ය වන අතර සම්පූර්ණ 04කට පිළිතුරු සැපයිය යුතු ය.

| | | |
|---|---|---|
| 02 ප්‍රශ්නය | අවබෝධය | ලකුණු 12 (02 x 6 = 12) |
| | සාරාංශය | ලකුණු 13 (02 + 03 + 08 = 13) |
| 03 ප්‍රශ්නය | රචනය | ලකුණු 25 |
| 04 වන ප්‍රශ්නයේ සිට 08 වන ප්‍රශ්නය තෙක් පිළිතුරු සඳහා - | | ලකුණු 15 |

**(II වන පත්‍රය සඳහා මුළු ලකුණු 20 + 25 + 25 + 15 + 15 = 100)**

| | |
|---|---|
| අවසාන ලකුණු ගණනය කිරීම I පත්‍රය | = 100 |
| II පත්‍රය | = 100 |
| **අවසාන ලකුණු** | **= 200 ÷ 2 = <u>100</u>** |

# අභිමතාර්ථ

## II පත්‍රය - I කොටස

සිංහල අක්ෂර මාලාව, ඊට අයත් විවිධ ප්‍රභේද, පද සංයෝජනය, උක්තාඛ්‍යාත රීති හා භාෂාවේ ප්‍රමුඛ ව්‍යාකරණාංග පිළිබඳ විභාග අපේක්ෂකයන් සතු අවබෝධය විමර්ශනය කිරීම මින් අපේක්ෂිත ය.

## II පත්‍රය - II කොටස

අපේක්ෂකයන් සතු සංශ්ලේෂණ හා විශ්ලේෂණ ශක්‍යතාව ද විචාරශීලී චින්තනය, නිර්මාණාත්මක කුසලතා මෙන් ම අනිර්දිෂ්ට ගද්‍ය පාඨවල අර්ථාවබෝධය මැන බැලීම ද වාක්‍ය රීති, ප්‍රමුඛ ව්‍යාකරණාංග හා ශෛලීය ලක්ෂණ පිළිබඳ කුසලතා විමර්ශනය කිරීම ද මේ කොටසින් අපේක්ෂිත ය.

1.6 තත්සම පද පමණක් යෙදී ඇති වරණය කුමක් ද?

(1) ක්‍රම, ග්‍රම, තඹ, අඹ (2) සාධන, බාදන, අඳන, ඡේදන
(3) සීල, බාල, ඇළ, නීල (4) ඇත, නැත, ගත, ශත
(5) දුෂ්ට, ඉෂ්ට, පිෂ්ට, අෂ්ට (......)

1.7 තද්භව වචන පමණක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) අඳ, සඳ, හඳ, මඳ (2) පෙම්, දම්, කැම, කුම
(3) අද, පද, සාද, මෘදු (4) මිතුරු, සතුරු, කර්තෘ, පවිත්‍ර
(5) ඇඳුම්, පඩි, බාහු, ධාතු (......)

1.8 විභක්ති, ද්වන්ද්ව, අව්‍යය, විශේෂණ යන සමාස පද අනුපිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(1) කොහුඉදල්, නිදොස්, ලුණුපැදුර, හදවිල
(2) හදවිල, කොහුඉදල්, ලුණුපැදුර, නිදොස්
(3) ලුණුපැදුර, කොහුඉදල්, නිදොස්, හදවිල
(4) නිදොස්, හදවිල, කොහුඉදල්, ලුණුපැදුර
(5) ලුණුපැදුර, නිදොස්, හදවිල, කොහුඉදල් (......)

1.9 කෘදන්තයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) නැසුමක්, දෙසුමන්, උතුමන්, වැසුමන් (2) හැරූ, තේරූ, පැරූ, බේරූ
(3) අඳින, වඳින, හිඳින, විඳින (4) පැසුණු, නැසුණු, ගැසුණු, ඇසුණු
(5) පැළුම, තැළුම, වෙළුම, පෙළුම (......)

1.10 පහත දැක්වෙන උද්ධෘතවල තද කළු අකුරෙන් මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(අ) "**ගොස්** බරණැස් පුරට"
(ආ) "දුබික් දුරු **වේවා**"
(ඉ) "අස දැක් ත යන මඟ සලකුණු මෙතැන් සිට"
(ඊ) "**කෙළිමින්** යෙති බැඳ බඹුරු"

(1) විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, ආශිර්වාද ක්‍රියා
(2) පූර්ව ක්‍රියා, විධි ක්‍රියා, ආශිර්වාද ක්‍රියා, මිශ්‍ර ක්‍රියා
(3) පූර්ව ක්‍රියා, ආශිර්වාද ක්‍රියා, විධි ක්‍රියා, මිශ්‍ර ක්‍රියා
(4) මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, ආශිර්වාද ක්‍රියා
(5) ආශිර්වාද ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා, පූර්ව ක්‍රියා (......)

1.11 තද්ධිතයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) ප්‍රමුඛතම, මධුරතම, වෘද්ධතම, ප්‍රධානතම
(2) රූමත්, ධීමත්, ශ්‍රීමත්, දිරිමත්
(3) මුහුණත්, ලවනත්, දකුණත්, සවනත්
(4) ආගමික, ශාසනික, දේශපාලනික, සාගරික
(5) දැවමුවා, මිණිමුවා, සෙල්මුවා, රන්මුවා

1.12 උපසර්ගයක් යෙදී **නැති** පදයක් සහිත පද පේළිය තෝරන්න.

(1) නිරවුල්, නිලකුණු, නිවහල්, නිහඬ
(2) අභියාචන, අභිධර්ම, අභිජනන, අභිනන්දන
(3) අනුගමන, අනුමෝදනා, අනුධාවන, අනුක්‍රමික
(4) නිරනුමාන, නිරාගමික, නිරුත්තර, නිරන්තර
(5) සුපුබුදු, සුමඟුල්, සුවහස්, සුපහන් (......)

1.13 නිපාතයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) නිරතුරු, නිති, නිතර, නිබඳ (2) මිස, මුත්, විනා, හැර
(3) යළි, නැවත, ඉක්බිති, පුවත (4) සමග, හා, සහ, කැටුව
(5) දක්වා, තෙක්, තාක්, පටන්

1.14 "විදුහල්පතිවරුන්ගේ සාමූහික උත්සාහයෙන් දිස්ත්‍රික්කයේ අධ්‍යාපන තත්ත්වය **ප්‍රවර්ධනය** විය." යන වාක්‍යයෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව **තද කළු අකුරෙන්** දක්වා ඇති පද අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංගවලට ද?

(1) විභක්ති, තද්ධිත, උපසර්ග
(2) උපසර්ග, විභක්ති, තද්ධිත
(3) උපසර්ග, තද්ධිත, විභක්ති
(4) විභක්ති, උපසර්ග, තද්ධිත
(5) තද්ධිත, උපසර්ග, විභක්ති (.....)

1.15 සම්මත ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කෙරෙන ක්‍රියා රූප සහිත වරණය තෝරන්න.

(1) බැන්දේ ය, ඇන්දෝ ය, වැන්දේ ය, සින්දෝ ය.
(2) දා, කා, පා, කෑ
(3) ලැබුවේ ය, ලැබුවා ය, ලැබුවෝ ය, ලැබූහෝ ය.
(4) සාරවයි, නටවයි, ලියවයි, බලවයි.
(5) අල්ලමු, ඉල්ලමු, දල්වමු, එල්ලමි.

1.16 සමාසයක් නොවන පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) කුඹිවු, කුකවි, කුරුලු, කුපුරිස්
(2) දෙව්විමන, ළමාලොව, හංසනාදය, ඇස්පිහාටු
(3) පැන්පැන්සල්, දෑත්දෙපා, හට්ටිමුට්ටි, අකාවටපැදුරු
(4) තිලකුණු, සදෙව්ලොව, පස්පියුම්, සත්කුළුපව්
(5) අනෞචිත්‍ය, අනාගත, අනාදර, අනල්ප

1.17 එක ම වර්ගයට අයත් සන්ධි පද පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) ඇඳුරිඳු, මහැඳුරු, රියැදුරු, රජකුමා
(2) සකලාංග, ජනාධිපති, සාමාන්‍යාධිකාරී, මනෝපකාරී
(3) ගංතෙර, මුංඇට, රම්මිණි, සුළංරැල්ල
(4) ඔවුනොවුන්, අතිනත, දෙවඟන, පසිඳුරන්
(5) පූජෝත්සවය, ග්‍රාමෝදය, ශ්‍රමාභිමානී, දෙවදොපදේශ

1.18 ව්‍යාකරණානුකූල ව නොගැළපෙන වරණය කුමක් ද?

(1) ඉගිම්, කපටි, කරටි, ඉහටි
(2) පාපියුම්, රාගගින්න, කරුණාජලය, සසරදනව්ව
(3) වෛශාරද්‍ය, වෛකල්‍ය, නෛපුණ්‍ය, වෛශාඛ්‍ය
(4) සාධනීය, වන්දනීය, ප්‍රාර්ථනීය, නින්දනීය
(5) මැවිලි, රැවිලි, දිවිලි, නැටිලි (.....)

1.19 ව්‍යාකරණානුකූල ව නිරවද්‍ය වාක්‍යය තෝරන්න.

(1) නායකයාණනි, අධීන වූවෙක් සේ කටයුතු කරන්න.
(2) ගුරුවරු මැනවින් උගන්වති'යි දෙමාපියෝ සිතති.
(3) අසත්පුරුෂයෝ වංචාකාරයෝ ද කෛරාටිකයෝ ද වෙති.
(4) මා නිදුක් වෙම්වා!
(5) අප නීතිගරුක පුරවැසියන් වෙමු.

1.20 ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍යය තෝරන්න.

(1) රටදැය නැඟීමට වැඩ කිරීම පාලකයාගේ යුතුකම ය.
(2) කාත් කවුරුවත් නැති අහිංසකයන්ට පීඩා නොකළ යුතු ය.
(3) රටේ ධනයෙන් බාගෙට බාගයක් අතළොස්සක් වූ ජාවාරම්කාරයන් ළඟ ඇත.
(4) නීන්දැරි මිනිහෙක් ගේට්ටුව ගාවට වී ඇගේ දිහා බලා සිටියේ ය.
(5) සිරිසේන පනිවිටුව ළිඳට දමා වතුර එකක් අරන් ඇඟේ හලා ගත්තේ ය. (.....)

(ලකුණු 20 යි.)

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

**අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2024**

**II පත්‍රය**

| විෂය අංකය / பாட இலக்கம் | 71 | විෂයය / பாடம் | සිංහල |
|---|---|---|---|

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

### I කොටස

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු விடை இல. |
|---|---|---|---|
| 01. | 4 | 11. | 3 |
| 02. | 4 | 12. | 5 |
| 03. | 2 | 13. | 3 |
| 04. | 1 | 14. | 1 |
| 05. | 4 | 15. | 4 |
| 06. | 5 | 16. | 1 |
| 07. | 1 | 17. | 4 |
| 08. | 3 | 18. | 1 |
| 09. | 1 | 19. | |
| 10. | 3 | 20. | |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல்

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 01 ලකුණ බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 20 = 20

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

| | |
|---|---|
| සිංහල | II |
| சிங்களம் | II |
| Sinhala | II |

**71 S II**

## II කොටස

- මෙම කොටසින් **2, 3** ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

**2.** (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මෙතෙක් තහවුරු වී ඇති අදහස නම් මේ ස්ත්‍රීරූප දිව්‍යාප්සරාවන්ගේ ය යනු යි. එම අදහසෙහි බොහෝ දෙනකුගේ සිත් ඇලීගන්නා සේ ද පෙනේ. රූපවල යටිකය කෙටි කර දක්වා තිබීම හා මේඝකූට නිරූපණ වශයෙන් විස්තර කොට ඇති දෘශ්‍යමාන තෙලිතුඩු සහරවල් ද මෙම සිද්ධාන්තයට තුඩු දෙන ප්‍රධාන කරුණු ගණයෙහි වැටේ. මෙම රූප සැබෑ වශයෙන් ම මනුෂ්‍ය රූප යැයි ද ඒවා තත්කාලීන රාජසභාවෙහි වූවන්ගේ යැයි ද තහවුරු කළ හැකි ය. ඇතැමක් ජීවමාන ප්‍රමාණයට වඩා විශාල වන සේ හා ඇතැමක් කුඩා වන සේ ශරීරයෙන් හතරෙන් තුන් කොටසක් පමණක් පෙනෙන අයුරින් රූප සිත්තම් කර තිබීම ඇස් හමුයෙහි මායාවක් මවා පෑම පිණිස හා ඒ තයින් පර්වත කෙවෙනියෙහි වූ සීමාසහිත අවකාශයෙන් හැකි තරම් ප්‍රයෝජන ගනු පිණිස යොදා ගන්නා ලද අවශ්‍ය ශිල්පීය උපක්‍රම වී යැයි විස්තර කළ හැකි වේ.

රූපවල සම්පූර්ණ ශරීරය ම සිතුවම් කිරීමට ප්‍රයත්න දරන ලද නම්, චිත්‍ර ශිල්පියාට ලැබුණු අවකාශයෙන් නිසි සේ ප්‍රයෝජන ගත නො හැකි වනු පමණක් නො ව චිත්‍ර ප්‍රකට ව පෙනෙන සේ නිරූපණය කිරීමට ද ශිල්පියා නොසමත් වනු ඇත. කෙසේ වුව ද සෑහෙන දුරක් පහතින් සිට නිරීක්ෂණය කරන කල ඒවායේ නියම අගය මතු වී පෙනෙන හෙයින්, මෙම චිත්‍ර කිට්ටුවෙන් සිට බැලීමට කිසි කලෙකත් අදහස් කරන ලදැයි නො සිතේ. එබඳු කලින් තෝරා පිහිටුවන ලද නිරීක්ෂණ ස්ථානයක් කලෙක දී තිබෙන්නට ඇත. එහෙත් එබන්දක කිසිදු ලකුණක් මේ තාක් සොයා ගෙන නැත. ශිල්පීය උපක්‍රමය තවත් තර කෙරෙන ලෙස රූප ජීවමාන ප්‍රමාණයට වඩා විශාල කර ඇඳ තිබේ. කිසිදු වලාකුළු නිරූපණයක්, මෙහි වේ නම්, ඒවා රූප වෙන් කොට දැක්වීමෙන් නිරීක්ෂණයට පහසුවක් සලසා ලීම සඳහාත් අහසෙහි සිටින ආකාරය හඟවන සියුම් පෙනුමක් ඇති කරවනු සඳහාත් එසේ ම චිත්‍ර මතු පිට ප්‍රකර්ෂවත් ආලෝකයක් වැටෙනු වළක්වනු සඳහාත් චිත්‍රවල ඉදිරි කොටසෙහි දක්වන්නට ඇත; අන් කිසිදු අර්ථයක් පිණිස නො වේ. මෙම චිත්‍රවල නිර්මාණය හා මෙබඳු අදහසක් වඩාත් ම සහසුවෙන් ගැළපෙයි. තව ද, සතරේ පේළි වශයෙන් පිළියෙල කරන ලද රූප පන්සියයක් පමණ මුල දී මෙහි තිබූ බව ද මෙහි දී සැලකිය යුතු වෙයි. මෙම මතයට දෙවියන් පිළිබඳ අදහසක් රැවා ලීමට ඇති ඉඩ, රූපවලින් ප්‍රකාශ කෙරෙන හැඟීමෙන්, ඉරියව්වෙන් හා මනුෂ්‍ය වර්ග විශේෂවලින් ද ඇවිරේ.

අනේකප්‍රකාර අලංකාරවත් ඇඳුමින් හා ආභරණවලින් සැරසුණු මේ කාන්තාවන් මහා උත්සවයකට සූදානම් වන්නන් විය හැකි ද? උත්සව අවස්ථා කිසි විටෙකත් ගැඹුරු කල්පනාවෙහි යෙදී සිටින අවස්ථා නො වී ය. ප්‍රීතිය කෙරෙහි නැමුණු සිතෙහි පැන නගින ප්‍රකර්ෂවත් හැඟීම්, ශරීරය හා අත්පා විශේෂයෙන් ම මුහුණ නමැති කැඩපතින් පිළිබිඹු විය යුතු යි.

(i) මෙම ස්ත්‍රී රූපවලින් නිරූපණය වන්නෝ දිව්‍ය අප්සරාවෝ ය යන අදහස පිළිගත හැකි සාක්ෂ්‍ය මොනවා ද?

(ii) දෙවියන් පිළිබඳ අදහස හුවා දැක්වීමට ඇති ඉඩකඩ ඇහිරීම (ඇවිරීම) කෙරෙහි බල පාන සාධක මොනවා ද?

(iii) ඉහත ඡේදයට අනුව මෙහි ඇඳ ඇති රූප සැබෑ වශයෙන් ම කවරකුගේ යැයි තහවුරු කළ හැකි ද?

(iv) වලාකුළු නිරූපණය මගින් අපේක්ෂිත කරුණු කීයක් මෙහි දැක්වේ ද?

(v) රූපවල සම්පූර්ණ ශරීරය ම සිතුවම් කිරීමට ප්‍රයත්න දරන ලද නම් චිත්‍ර ශිල්පියාට මුහුණ දීමට සිදු වන අපහසුකම් මොනවා ද?

(vi) මේ කාන්තාවන් මහා උත්සවයකට සූදානම් වන්නන් නො වන බව සිතීමට බල පාන ලක්ෂණය වශයෙන් මෙහි දැක්වෙන්නේ කුමක් ද?

**(2) (අ)**

**(i)** **රූපවල යටිකය** කෙටි කර දක්වා තිබීම හා මෙසකුට නිරූපණ වශයෙන් විස්තර කොට ඇති **අශ්‍යාමාන කෙලිතුඩු** පහරවල් දක්නට ලැබීම **(එක කරුණකට 01 ලකුණ බැගිනි.)**

**(ii)** **(දෙවියන් පිළිබඳ** අදහස හුවා දැක්වීමට ඇති ඉඩකඩ ඇතිරෙනුයේ) රූපවලින් ප්‍රකාශ කෙරෙන **හැඟීමෙන්, ඉරියව්වෙන්** හා මනුෂ්‍ය වර්ග විශේෂවලින් ය. **(කරුණු 2කට ලකුණු 01 යි. කරුණු 3ට ලකුණු 02 යි.)**

**(iii)** **මනුෂ්‍ය රූප බව (තත්කාලීන රාජ සභාවෙහි වූවන්ගේ රූප බැව් දක්වා ඇත්තේ නම් එක් ලකුණක් ප්‍රදානය කරන්න.)**

**(iv)** **තුන යි.**

- **නිරීක්ෂණ පහසුව** සලසා ලීම
- **අහසෙහි සිටින** අයුරු හැඟවීම
- **චිත්‍රවලට ප්‍රකර්ෂවත් ආලෝකය වැටීම වැළැක්වීම**

**(සංඛ්‍යාත්මක ව නො දක්වා කරුණු තුන දක්වා තිබේ නම් 01 ලකුණකි. කරුණු තුනට අඩු නම් ලකුණු ප්‍රදානය නො කෙරේ.)**

**(v)** අවකාශයෙන් නිසි සේ ප්‍රයෝජන ගත නොහැකි වීම හා චිත්‍ර ප්‍රකට ව පෙනෙන සේ නිරූපණය කිරීමට නොහැකි වීම

**(එක කරුණකට 01 ලකුණ බැගිනි)**

**(vi)** උත්සව අවස්ථාවල දී ගැඹුරු කල්පනාවල නිමග්න නොවීම (**'ප්‍රීතිය ප්‍රකාශ කෙරෙන ප්‍රකාශනවක් හැඟීම් මුහුණෙන් පිළිබිඹු නොවන්නේ නම් උත්සව අවස්ථාවක් නො වනු ඇත' යන්න දක්වා ඇත්නම් එක් ලකුණක් ප්‍රදානය කරන්න.)**

(ලකුණු 02 x 06 = 12 යි.)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා, සාරාංශය අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

ලාංකික සිසුනට ඉගැන්වීමේ දී තමන් යුරෝපයෙහි පුරුදු ව සිටි ක්‍රමවලින් තරමක් දුරට ඈත් වීමට මිෂනාරීනට සිදු විය. එසේ වූයේ මේ දිවයිනෙහි ඔවුන්ගේ අධ්‍යාපනික කටයුතු බොහෝ දුරට දුරෝනාටි ස්වභාවයක් ගත් නිසා ය.

මෙහි දී ඔවුනට යුරෝපයෙහි දී මෙන් නො ව ශිෂ්‍යයාගේ ස්මරණ ශක්තිය කෙරෙහි වැඩි බලාපොරොත්තු තැබීමට සිදු විය. ශිෂ්‍යයනට කියවීම පවා බැරි අවදියේ දී ම ආගමික ශික්ෂා වනපොත් කරවන ලදි. මෙසේ ස්මරණ ශක්තිය කෙරෙහි බලාපොරොත්තු තැබීමට සිදු වූයේ එක් අතකින් පොත් හිඟකම්, විශේෂයෙන් දේශීය භාෂාවලින් රචිත පොත් හිඟ වීම ද අනෙක් අතින් විධිමත් අධ්‍යාපනයක් සඳහා පහසුකම් නොමැති වීම ද නිසා ය. තව ද, එකල පැවති තත්ත්වය අනුව ශිෂ්‍යයන් ලවා වාච්‍ය ඉද්ධා ලියවිලි කොටියස වනපොත් කරවීම වූකලී, ඔවුන් කියවීමට පුරුදු වීමෙන් පසු කෙරෙන පොත් පරිශීලනයෙන් ලබන ඉගෙනුමට වඩා, ඔවුනට ක්‍රිස්තියානි ලබ්ධියෙහි මූලික දේශනා පිළිබඳ ව කඩිනමින් දැන ගැනීමට සැලැස්විය හැකි ක්‍රමයක් විය. ආගම ඉගෙනීම කෙතරම් වැදගත් හා කෙතරම් අත්‍යවශ්‍ය වී ද යත් ශිෂ්‍යයන් කියවීමට උගන්නා තෙක් එය පමා කළ හැකි නොවී ය. මේ වනාහි ප්‍රැන්සිස් සාවියර් අනුගමනය කළ ක්‍රමය ම යි. එනම්, ශිෂ්‍යයන් ලවා පාඩම් වනපොත් කරවා අමතක වීම වළක්වනු පිණිස නැවත නැවත කීමට සැලැස්වීම යි.

වනපොත් කිරීම මේ රටෙහි පාරම්පරික ඉගැන්වීමේ ක්‍රමය වූ හෙයින් ලාංකික ශිෂ්‍යයා ද නිසැකයෙන් ම මෙන් මේ කාර්යයට හුරු වන්නට ඇත. ඇත්තෙන් ම, පුරා සිය වසර ගණනාවක් ම ආගමික හා වෙනත් ග්‍රන්ථ සම්පූර්ණයෙන් ම මුඛ පරම්පරාවෙන් පැවතුණා පමණක් නො ව මේ කාර්යය පහසු කරනු වස් නිඝණ්ඩු, ව්‍යාකරණ හා වෛද්‍ය ග්‍රන්ථ බඳු කෘතීන් පවා පැදියෙන් ලියන ලද්දේ ය. මෙසේ මිෂනාරීහු ලාංකික ශිෂ්‍යයන්ගේ වනපොත් කිරීමේ හැකියාව ප්‍රශංසා මුඛයෙන් වර්ණනා කරති.

(ආ) පහත කරුණු සාරාංශයෙහි අන්තර්ගත විය යුතු ය.

- වනපොත් කිරීම ලාංකේය සාම්ප්‍රදායික ඉගැන්වීම් ක්‍රමය වීම
- ඒ සඳහා විවිධ විෂයන්ට අදාළ කෘති පවා පද්‍ය ආකෘතියෙන් ලියා තිබීම
- ස්මරණ ශක්තියට ප්‍රමුඛතාව දුන් මෙම දේශීය අධ්‍යාපන ක්‍රමය යුරෝපීයයන් ද අනුගමනය කිරීම
- අමතක වීම වැළැක්වීම සඳහා නැවත නැවත කියවීමේ ක්‍රමය අනුගමනය කිරීම

ඉහත කරුණු ඇතුළත් ව ලේඛන ව්‍යවහාරයෙන් සාරාංශය ලියා තිබිය යුතු ය. සාරාංශය එක් ඡේදයක් ලෙස දක්වා තිබිය යුතු අතර, ඡේදවලට බෙදා ඇති නම්, සමස්තයෙන් ලකුණු 2ක් අඩු වේ. වචන සංඛ්‍යාව 75 - 85 අතර තිබිය යුතු ය. එම ප්‍රමාණය අඩු හෝ වැඩි හෝ වේ නම්, වචන ප්‍රමාණයට නියමිත ලකුණු 2ක අඩු වේ.

| | |
|---|---|
| සාරාංශයේ නියමිත වචන ප්‍රමාණයට | - ලකුණු 02 යි. |
| භාෂා නිරවද්‍යතාවට | - ලකුණු 03 යි. |
| අන්තර්ගතයට | - ලකුණු 08 යි. |

**3.** දී ඇති මාතෘකාවලින් එකකට අදාළ ව වචන **300-350** අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) පුරා වස්තු සංරක්ෂණයෙහි ලා රජය සහ මහජනතාව සතු කාර්යභාරය
(ii) ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑම පාලනය කිරීමේ කාලීන අවශ්‍යතාව
(iii) මෙරට සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීමේ දී සාම්ප්‍රදායික සංස්කෘතිකාංගවලින් ලැබිය හැකි දායකත්වය
(iv) පොලිතීන් භාවිතය අවම කිරීමට අනුගමනය කළ හැකි උපාය මාර්ග
(v) දේශපාලන බල පෑම්වලින් තොර වූ රාජ්‍ය සේවාවක් ස්ථාපිත කිරීමේ වැදගත්කම

**වචන සංඛ්‍යාව 300 - 350 අතර වේ නම් ඉහළ ලකුණු ප්‍රදානය කළ හැකි ය. වචන 400ට වැඩි වේ නම් හෝ 250ට අඩු වේ නම් හෝ ලකුණු 03ක් අඩු කළ යුතු වේ.**

වාක්‍ය රචනයට ලකුණු දීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම සුදුසු ය.

i. රචනය සඳහා තෝරා ගත් මාතෘකාව යටතේ ප්‍රමාණවත් ලෙස කරුණු ඒකරාශීකරණය
ii. එම කරුණු සංවිධානාත්මක ව ඉදිරිපත් කිරීම
iii. කරුණුවල පැහැදිලි බව
iv. නිරවද්‍ය අක්ෂර වින්‍යාසය අනුගමනය කර තිබීම
v. ව්‍යාකරණ දෝෂ රහිත වීම
vi. භාෂාව ව්‍යක්ත ලෙස හැසිර වීම
vii. සුදුසු ලෙස පද බෙදීම හා ඡේද වෙන් කිරීම
viii. කියවිය හැකි සේ අත්අකුරු පැහැදිලි වීම

✶ විවිධ භාෂාත්මක ප්‍රයෝග භාවිතය (මෙහි දී උපමා, රූපක, ආප්තෝපදේශ, ප්‍රස්තාව පිරුළු වැනි අංග ගැන සැලකිල්ල යොමු කරන්න. එහෙත් ඒ වෙනුවෙන් වෙන වෙන ම ලකුණු දීම අනවශ්‍ය ය. සමස්තයක් වශයෙන් රචනාවෙහි මෙකී අංග සලකා ලකුණු ප්‍රදානය කළ හැකි ය.)

(ලකුණු 25 යි.)

4. (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

(i) කළමනාකාරතුමා හෙවත් කළමනාකාරතුමීය උත්සවයට සහභාගි වෙයි.

(ii) අපි රටට හිතැත්තෝ වෙමු.

(iii) සමාජයෙහි සිවුපාවෝ වැනි මිනිස්සු ඇත.

(iv) ධාවන තරගයෙන් ජය ලබන්නී කුමුදුනී ය.

(v) ගොවියන් වනාහි රටට බත සපයන්නෝ ය.

හෝ

(අ) (i) කළමනාකාරතුමා නොහොත් කළමනාකාරතුමිය උත්සවයට සහභාගි වෙයි.

(ii) නිවැරදි වාක්‍යයකි.

(iii) සමාජයෙහි සිවුපාවුන් වැනි මිනිස්සු ඇත.

(iv) නිවැරදි වාක්‍යයකි.

(v) ගොවියෝ වනාහි රටට බත සපයන්නෝ ය.

(ලකුණු 01 x 5 = 05 යි.)

(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

(i) මහා පරාක්‍රමබාහු රජ්ජුරුවෝ පරාක්‍රම සමුද්‍රය තැනවූහ.

(ii) කම්කරුවෝ මාර්ගය දෙපස ගස්වල අතු කපති.

(iii) අධ්‍යක්ෂවරයා සේවිකාවක කර්මාන්ත ශාලාවෙන් නෙරපා හරියි.

(iv) තාත්තා මේ ජීවිතයේ ඉහළට ම මා ඔසවා තැබුවේ ය.

(v) සෙන්පතියා තොප පලවා හැරියේ ය.

(ආ) (i) මහා පරාක්‍රමබාහු රජ්ජුරුවන් විසින් පරාක්‍රම සමුද්‍රය තැනවිණ/ තැනවිණි/ තැනවූයේ ය/ තනවනු ලැබී ය/ තනවනු ලැබිණ / තනවනු ලැබිණි/ තනවනු ලැබුවේ ය/ තනවන ලදි/ ලද්දේ ය.

(ii) කම්කරුවන් විසින් මාර්ගය දෙපස ගස්වල අතු කැපෙයි/කැපේ/කපනු ලබයි/ලැබෙයි/ලැබේ.

(iii) අධ්‍යක්ෂවරයා විසින් සේවිකාවක් කර්මාන්ත ශාලාවෙන් නෙරපා හැරෙයි/ හැරේ/ හරිනු ලබයි/ ලැබෙයි/ලැබේ.

(iv) තාත්තා විසින් මේ ජීවිතයේ ඉහළට ම මම ඔසවා තැබුණෙමි/තබනු ලැබුවෙමි/ තබන ලද්දෙමි.

(v) සෙන්පතියා විසින් තොපි පලවා හැරුණෙහු/හරිනු ලැබූහු /ලැබුවෙහු/ ලැබුණෙහු/ පලවා හරින ලද්දෙහු / ලදහු/ ලද්දහු.

(ලකුණු 01 x 5 = 05 යි.)

(ඇ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පද වරහන් තුළින් තෝරා ලියන්න.

(i) මුහන්දිරම්තුමා (ධනවතෙක් ද බලවතෙක් ද/ධනවතකු ද බලවතකු ද) (වෙයි/වෙති.)

(ii) හෙළයේ මහා ගන්ධර්වයා (හෙවත්/නොහොත්) ඩබ්ලිව්. ඩී. අමරදේව දක්ෂ (ගායකයෙක්/ගායකයකු) විය.

(iii) (මම/මා) ධනසිරි නම් (ව්‍යාපාරිකයෙක්/ව්‍යාපාරිකයකු) වෙමි.

(iv) බොහෝ (කම්කරුවන්/කම්කරුවෝ) වැඩ වරද්දී (ඇතැමෙක්/ඇතැමකු) වැඩට යති.

(v) නිවහල් දේශයක් උදෙසා (මිනිස්සු/මිනිසුන්) ජීවිතය කැප කළ (යුත්තේ ය/යුත්තෝ ය.)

(ඇ) (i) ධනවතෙක් ද බලවතෙක් ද - වෙයි.

(ii) හෙවත් - ගායකයෙක්

(iii) මම - ව්‍යාපාරිකයෙක්

(vi) කම්කරුවන් - ඇතැමෙක්

(v) මිනිස්සු - යුත්තෝ ය. (ලකුණු 01 x 5 = 05 යි.)

**5.** පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. **ඒවායෙහි අනු අංගය** දක්වන්න.

(i) **නිරතුරු සුමිතුරු** වෙස් ගත් කලණ මිතුරු තෙම **සුරතුර** බඳු වී ය.
(**නිරතුරු** - සන්ධි, **සුමිතුරු** - උපසර්ග, **සුරතුර** - සමාස)

(ii) කාන්තාවගේ **නෙතග** රැඳි කඳුළ ද මුවග **රැඳි** සිනහව ද අවියට වඩා **බලවත්** ය.
(**නෙතග** - සන්ධි, **රැඳි** - කෘදන්ත, **බලවත්** - තද්ධිත)

(iii) **අනුකම්පා** විරහිත **පාලකයෝ** ජනයාට දුක් **දී** පීඩාවට පත් කරති.
(**අනුකම්පා** - සමාස, **පාලකයෝ** - විභක්ති, **දී** - ක්‍රියා)

(iv) **විදෙස්** රටවල පවා **පතළ** කීර්තියක් ඇති උගත්තු **ලංකාවෙහි** ඇත.
(**විදෙස්** - උපසර්ග, **පතළ** - කෘදන්ත, **ලංකාවෙහි** - විභක්ති)

(v) උන්මාදචිත්‍රාවෝ **නෙතුපුලින්** ද රතදරින් ද **සිහිනිගින් ද** ශෝභමානයෝ ය.
(**නෙතුපුලින්** - සමාස, **සිහිනිගින්** - සන්ධි, **ද** - නිපාත) (ලකුණු 03 × 5 =15 යි.)

| වචනය | ව්‍යාකරණ අංගය | අනු - අංගය |
|---|---|---|
| i නිරතුරු | සන්ධි | ආගම සන්ධිය/ අගම් සඳ |
| සුමිතුරු | උපසර්ග | භූෂණාර්ථය/ අර්ථය වැඩි කිරීම/ උද්දීපනාර්ථය/උත්කෘෂ්ටාර්ථය |
| සුරතුර | සමාස | විභක්ති සමාසය/විබත් සමස්/සම්බන්ධ විභක්ති සමාසය/සබඳ විබත් සමස් |
| ii නෙතග | සන්ධි | ස්වර සන්ධිය/ සර සඳ /ආරෝහණ සන්ධිය |
| රැඳි | කෘදන්ත | අතීත කාල කෘදන්ත/ කර්තෘ කාරක කෘදන්ත/අතීත කාල කර්තෘ කාරක කෘදන්ත |
| බලවත් | තද්ධිත | අස්ත්‍යර්ථය/ඇත යන අර්ථය |
| iii අනුකම්පා | සමාස | අව්‍යය සමාස/ අවිය සමස්/ 'යව'ආදි ගණයේ අව්‍යය සමාසය |
| පාලකයෝ | විභක්ති | ප්‍රථමා විභක්තිය/ පෙර විබත |
| දී | ක්‍රියා | පූර්ව ක්‍රියා / පෙර කිරිය |
| iv විදෙස් | උපසර්ග | විරුද්ධාර්ථය |
| පතළ | කෘදන්ත | අතීත කාල කෘදන්ත/ කර්තෘ කාරක කෘදන්ත / අතීත කාල කර්තෘ කාරක කෘදන්ත |
| ලංකාවෙහි | විභක්ති | ආධාර විභක්ති / අදර විබත |
| v නෙතුපුලින් | සමාස | විශේෂණ සමාස / වෙසෙසුන් සමස් / උපමාන උත්තර පද සමාස / උපමාන පර පද සමාස |
| සිහිනිගින් | සන්ධි | ස්වර සන්ධිය/ සර සඳ /ආරෝහණ සන්ධිය |
| | නිපාත | සමුච්චයාර්ථය/ පද සම්බන්ධ කිරීම් අර්ථය/ පද කැටි කිරීම අර්ථය |

(ලකුණු (3×5 = 15 යි.)

6. (අ) පහත දැක්වෙන වාක්‍යවල හිස් තැනට වඩාත් ම ගැළපෙන පදය වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(i) ගුණවත්, ...................... දරු පරපුරක් බිහි කිරීමට විෂයමාලා සංශෝධනයක් අත්‍යවශ්‍ය ය.

(ii) ...................... දමින් බැඳී ජීවත් වීමට සියලු පුරවැසියන් අදිටන් කර ගත යුතු ය.

(iii) ජනේලය විවෘත කළ වහා ම ...................... වාතාශ්‍රය කාමරයට කඩා වැදුණේ ය.

(iv) ...................... බීම අධික ව පානය කිරීම ශරීර සෞඛ්‍යයට හානිකර ය.

(v) අනතිමානී ව කටයුතු කිරීම ...................... පුද්ගලයාගේ ප්‍රමුඛ ලක්ෂණයකි.

(vi) කෙතරම් චිත්ත පීඩා පැමිණියද ඔවුන් අතර වූ ...................... ප්‍රේමය මඳකිනුදු අඩු නො වී ය.

(සහෝදර, නැණවත්, සොයුරු, සිසිල්, ඥානවන්ත, ශීතල)

(අ)

(i) නැණවත්

(ii) සොයුරු

(iii) ශීතල

(iv) සිසිල්

(v) ඥානවන්ත

(vi) සහෝදර

(ලකුණු 1/2 x 6 = 3 යි.)

(ආ) පහත දක්වා ඇති පද විසන්ධි කර ලියන්න.

(i) අපතර (ii) විෂමාචාර (iii) ඇද්දැකීම

(iv) සුළැඟිල්ල (v) දෑත (vi) මංගලෝත්සව

(ආ) (i) අප + අතර

(ii) විෂම + ආචාර

(iii) අත් + දැකීම

(iv) සුළු + ඇඟිල්ල

(v) දෙ + අත

(vi) මංගල + උත්සව

(ලකුණු 1/2 x 6 = 3 යි.)

(ඉ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

(i) **ගොවියා නගුලෙන්** සී සෑවේ ය.

(ii) **බළලකු මල්ලෙන්** එළියට පනින අයුරු මම දුටුවෙමි.

(iii) **දරුව, තලියේ** කිඹුලන් නො දකින්න.

(ඉ) (i) ගොවියා — ප්‍රථමා විභක්ති/පෙර විබත

නගුලෙන් — කරණ විභක්ති/කරණ විබත

(ii) බළලකු — කර්ම විභක්ති/කම් විබත

මල්ලෙන් — අවධි විභක්ති/ අවදි විබත

(iii) දරුව — ආලපන විභක්ති/ අලප් විබත

තලියේ — ආධාර විභක්ති/ අදර විබත

(ලකුණු 1/2 x 6 = 3 යි.)

(ඊ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන කොටස නැවත ලියන්න.

යාචකයා මල්ල කරෙහි ලා, හැරමිටිය අතින් ගෙන ගෙවුණු පාවහන් පයෙහි ලා ගමන් ඇරඹුවේ ය. විශාල ගේට්ටුවක් සහිත නිවසකට ඇතුළු වීමට සැරසෙද්දී "තෝ යන්නේ කොහේ ද යි මුරකාරයා කෑ ගැසී ය. අනේ මට බඩගිනියි හොඳට ම පිපාසයි; කලන්තෙ දාන්න වගෙයි."

(ඊ) යාචකයා මල්ල කරෙහි ලා, හැරමිටිය අතින් ගෙන**,** ගෙවුණු පාවහන් පයෙහි ලා ගමන් ඇරඹුවේ ය. විශාල ගේට්ටුවක් සහිත නිවසකට ඇතුළු වීමට සැරසෙද්දී "තෝ යන්නේ කොහේ ද**?"** යි මුරකාරයා කෑ ගැසී ය. **"**අනේ**!** මට බඩගිනියි**;** හොඳට ම පිපාසයි; කලන්තෙ දාන්න වගෙයි."

(ලකුණු 1/2 x 6 = 3 යි.)

(උ) පහත දැක්වෙන ප්‍රකාශවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

(i) "මම ශ්‍රී ලංකාව වංචාවෙන් හා දූෂණයෙන් මුදවා ගනිමි"යි ජනාධිපති කී ය.

(ii) "ශිෂ්‍යයෝ උනන්දුවෙන් හා කැපවීමෙන් වැඩ කළ යුත්තාහ"යි විදුහල්පතිතුමා පැවසී ය.

(iii) "නඩුකාරතුමනි, මාගේ දරුවා නිදහස් කරන්න"යි කාන්තාව පැවසුවා ය.

(උ) (i) තමා ශ්‍රී ලංකාව වංචාවෙන් හා දූෂණයෙන් මුදවා ගන්නා බව ජනාධිපති කී ය.

(ii) ශිෂ්‍යයන් උනන්දුවෙන් හා කැපවීමෙන් වැඩ කළ යුතු බව විදුහල්පතිතුමා පැවසී ය.

(iii) කාන්තාව නඩුකාරතුමා අමතා, තමාගේ දරුවා නිදහස් කරන ලෙස පැවසුවා ය./

[ආඥාර්ථය නොව]

නඩුකාරතුමා අමතා, තමාගේ දරුවා නිදහස් කරන ලෙස කාන්තාව පැවසුවා ය.

(ලකුණු 1 x 3 = 3 යි.)

7. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කාවන්තිස්ස නරදේවයාණෝ තම දරුවන් දෙදෙනාගේත් රටේත් අනාගතය ඉතා දූරදර්ශී ව සැලසුම් කළහ. ඊට නොදෙවෙනි ව තම පුතුන් දෙදෙනාගේ අනාගත අපේක්ෂාවන් මස්තකප්‍රාප්ත කිරීමෙහි ලා විහාර මහාදේවිය අධිකතර උත්සාහයක නිරත වූවා ය. කාවන්තිස්ස රජ්ජුරුවෝ ලක්දිව නානා ප්‍රදේශයන්හි විසූ **නන්දිමිත්‍ර, වේළුසුමන, ගෝඨයිම්බර, ඛඤ්ජදේව, පුස්සදේව, ලභිය, ථේරපුත්තාභය** ආදි යෝධයන් ගෙන්වා ගැමුණු කුමාරයා පිණිස සේනාව සංවිධානයෙහි ලා දැඩිතර උත්සාහයක් දැරූහ. මේ අතර තිස්ස කුමාරයා සහලින් රට ස්වයංපෝෂිත කිරීම පිණිස ගොවිතැන් සඳහා පිටත් කර හැරියහ. විටෙක කුමාරයන් දෙමදනා භික්ෂූන් වහන්සේ ඉදිරියට පමුණුවා අසමගි නොවන බවටත් ධර්මයට විරුද්ධ ව පාපකර ක්‍රියාවන්හි නොයෙදෙන බවටත් ශපථ කරවූහ. මේ අනුව කාවන්තිස්ස යනු අනාගතය විනිවිද දැක අනභිභවනීය වූත් ශ්‍රේෂ්ඨතර වූත් සේවාවක් සිදු කළ රජ කෙනකු වශයෙන් හඳුනා ගත හැකි ය.

(i) ඡේදයේ තද කළු අකුරින් මුද්‍රිත නාම පෙළ අකාරාදි පිළිවෙළින් ලියන්න.

(ii) තුලනාර්ථයේ/වඩා යන අර්ථයේ තද්ධිත පද තුනක් උපුටා දක්වන්න.

(iii) මෙහි ඇති ප්‍රථම පුරුෂ, අතීත කාල, බහුවචන ආඛ්‍යාත පද තුනක් උපුටා දක්වන්න.

(iv) රජ්ජුරුවෝ, ථේරපුත්තාභය, දැරූහ යන වචනවල යෙදී ඇති පිල්ලම් වෙන වෙන ම ලියන්න.

(v) මෙම ඡේදයෙහි ඇතුළත් අඝෝෂ හා ඝෝෂ මහාප්‍රාණ මදකක් අන්තර්ගත වචනයක් ලියන්න.

**7.** **(i)** ඛඤ්ජදේව, ගෝඨයිම්බර, ථේරපුත්තාභය, නන්දිමිත්‍ර, පුස්සදේව, ලභිය, වේළුසුමන

(ලකුණු 03 යි.)

**(ii)** අධිකතර
ඝටතර
පාපතර
ශ්‍රේෂ්ඨතර

(ලකුණු 1 x 3 = 3 යි.)

**(iii)** කළභ/ දැරූභ/ හැරියභ/ කරවූභ

(ලකුණු 1 x 3 = 3 යි.)

**(iv)** ජු - කෙටි පාපිල්ල/ කෙටි කොන් පාපිල්ල
රු - කෙටි පාපිල්ල/ කෙටි ඇද පාපිල්ල
වේ - කොම්බුව හා දීර්ඝත්ව ලක්ෂණය සහිත ඇලපිල්ල
රේ - කොම්බුව හා දීර්ඝත්ව ලක්ෂණය
පු - කෙටි පාපිල්ල/ කෙටි කොන් පාපිල්ල
ථා - ඇලපිල්ල
දැ - කෙටි ඇදය/ කෙටි ඇකාරාංශය/කෙටි ඇදපිල්ල
රූ - දීර්ඝ පාපිල්ල/ දීර්ඝ ඇද පාපිල්ල
**අදාළ වචනයේ සියලු පිල්ලම් නිවැරදි නම් පමණක් එක ලකුණක් ප්‍රදානය කරන්න.**

(ලකුණු 1 x 3 = 3 යි.)

(v) ථේරපුත්තාභය

(ලකුණු 3 යි.)

**( ලකුණු 3×5 = 15 යි.)**

**8.** පහත සඳහන් මාතෘකාවලින් තුනක් තෝරා ඒ ගැන කෙටි සටහන් ලියන්න.
(i) මහාප්‍රාණ අක්ෂර
(ii) අව්‍යය සමාසයේ 'න' ආදි වර්ගය
(iii) මිශ්‍ර ක්‍රියාව
(iv) පුරුෂ ලිංග නාම
(v) ගෝත්‍රවාචක තද්ධිත

**09.** **(i) මහාප්‍රාණ අක්ෂර**

පිහිත් වූ ප්‍රාණයක් හෙවත් ශ්වාසයක් සහිත ව උච්චාරණය කෙරෙන, ශබ්ද සංකේතිත අක්ෂර මහාප්‍රාණ අක්ෂර යනුවෙන් හැඳින්වේ. නූතන සිංහල හෝඩියේ මහාප්‍රාණ අක්ෂර 10ක් සඳහන් වේ.
වර්ගාක්ෂරයන්ගේ දෙ වන හා සිවු වන අක්ෂර මේ ගණයට අයත් වේ

ඛ, ඡ , ඨ , ථ , ඵ
ඝ , ඣ , ඪ , ධ , භ

**(ii) අව්‍යය සමාසයේ 'න' ආදි වර්ගය**

'නැත' යන අර්ථය සහිත 'න','නො' නිපාත මුලට යෙදී පසු පදය හා එක් ව සිදු වන සමාසය මේ වර්ගයට අයත් ය. 'න' නිපාතය යෙදීමේ දී එය ආකාර දෙකකට සිදු වේ.

- **පෙර පදයේ මුල් අක්ෂරය ස්වරයක් නම් ' න' වෙනුවට 'අන්' ආදේශ වේ.**

උදා:

න + අවශ්‍ය = අනවශ්‍ය

න + උපමා = අනුපමා

න + උත්තර = අනුත්තර

න + ඉටු = අනිටු

න + අදර = අනදර

- **පෙර පදයේ මුල් අක්ෂරය ව්‍යඤ්ජනයක් නම් ' න' වෙනුවට 'අ' ආදේශ වේ.**

උදා:
න + කුසල් = අකුසල්
න + ප්‍රකට = අප්‍රකට
න + ගුණ = අගුණ
න + කල් = අකල්

***සමහර විටෙක 'නො' නිපාතය නොවෙනස් ව ද යෙදේ.**

උදා: නො + හොඳ = නොහොඳ
නො + වෙනස් = නොවෙනස්

(මෙහි හැඳින්වීම සඳහා 'නො' නිපාතය පිළිබඳ ව සඳහන් නො වූව ද ලකුණු ලබා දිය හැකි ය. උදාහරණ සැපයීමේ දී කවර වර්ගයකට අයත් උදාහරණ ඇතුළත් වූව ද ප්‍රමාණවත් ය.)

**(iii) මිශ්‍ර ක්‍රියාව**

අනවසාන ක්‍රියාවකි. යම් කිසි වාක්‍යයක අවසාන ක්‍රියාව සමග එකට එක් ව කෙරෙන තවත් ක්‍රියාවක් වේ නම් එය මිශ්‍ර ක්‍රියාව ලෙස හැඳින්වේ.

උදා : මිනිසා බෙරය <u>වයමින්</u> කවි ගායනා කරයි.

**මිශ්‍ර ක්‍රියාව සෑදෙන්නේ ධාතු ප්‍රකෘතියට පර ව ' මින්, මින, මිනි' ආදි ප්‍රත්‍යයක් එකතු වීමෙනි.**

උදා: මින් - නටමින්, ගයමින්, බලමින්
මින - නටමින, ගයමින, බලමින
මිනි - නටමිනි, ගයමිනි, බලමිනි

**මීට අමතර ව පූර්ව ක්‍රියාව ද්විත්ව වීමෙන් ද මිශ්‍ර ක්‍රියා අර්ථය ලබා ගත හැකි ය.**

උදා : ගයමින් - ගයගයා
නටමින්- නටනටා

තරුණිය ගී <u>ගයගයා</u> නටන්නී ය.

❖ කවර උදාහරණ තුනක් ලබා දුන්න ද ලකුණු ප්‍රදානය කරන්න.

**(iv) පුරුෂ ලිංග නාම**

පුරුෂ ස්වභාවයක් හෝ පුරුෂ අර්ථයක් හෝ ප්‍රකට කෙරෙන නාම පද පුරුෂ ලිංග නාම යනුවෙන් හැඳින්වේ.

උදා: අශ්වයා, මිනිසා, කැස්බෑවා, සූර්ය තෙමේ

**(v)** **ගෞරවාර්ථයේ තද්ධිත**

නාම ප්‍රකෘතියකට පර ව 'ආණ, අණු, අණි' යන තද්ධිත ප්‍රත්‍යය එකතු වීමෙන් ගෞරවාර්ථයේ තද්ධිත පද සැකසේ.

පුරුෂ ලිංගාර්ථයේ පද සඳහා 'ආණ, අණු' ප්‍රත්‍යයන් සහ ස්ත්‍රී ලිංගාර්ථයේ පද සඳහා 'අණි' ප්‍රත්‍යය යෙදේ.

පිය + ආණ = පියාණ

රජ + ආණ = රජාණ

පුත් + අණු = පුතණු

තෙර + අණු = තෙරණු

තෙර + අණි = තෙරණි

දූ + අණි = දූවණි/ දියණි

(මෙහි හැඳින්වීමට ලකුණු 02 යි. උදාහරණවලට ලකුණු 03 යි.)

(ලකුණු 05 බැගින් මුළු ලකුණු 5 × 3 = ලකුණු 15 යි.)

PARCEL NO

LOL.lk
BookStore

# විභාග ඉලක්ක
# පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න





කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION | pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

**සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට**

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**